අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112785818
info@moe.gov.lk · www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/12/12/10/17-II

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2019.04. 03

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන I) 11 APR 2019 අධ්‍යාපන අමාත්‍යාංශය

සංස්ථාපන පාලන ශාඛාව 17 APR 2019 අධ්‍යාපන අමාත්‍යාංශය "ඉසුරුපාය" බත්තරමුල්ල.

චක්‍රලේඛ අංක - 08/2019

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පාසල් ප්‍රධානීන් වෙත,

## පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 1995.06.09 දිනැති අංක 1995/16 දරණ චක්‍රලේඛය අවලංගු කරන අතර මින් ඉදිරියට මෙම චක්‍රලේඛයේ උපදෙස් බලපැවැත්වෙනු ඇත.

2.0 නියමිත ආදායම් සීමාවට අයත් අඩු ආදායම්ලාභී පවුල්වල ඉගෙනීමෙහි දක්ෂතා සහිත දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීම සඳහාත් පාසල්වල හයවන ශ්‍රේණියට සිසුන් තෝරාගැනීම සඳහාත් පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණය තේරීම් පරීක්ෂණයක් වශයෙන් වාර්ෂිකව පවත්වනු ලැබේ.

3.0 එහෙත් වර්තමානය වන විට එම මූලික අරමුණුවලින් බැහැර වෙමින් දැඩි තරඟකාරී තත්වයක් උද්ගතව ඇති බව ද බොහෝ පාසල්වල පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ශිෂ්‍ය විවිධත්වය හා බුද්ධි වර්ධනය නොසලකා සියලුම සිසුනට දැඩි බලපෑමක් සිදු කරන බවද නිරීක්ෂණය වේ.

4.0 ඒ අනුව, මින් ඉදිරියට පාසල්වල පස්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාධාර සඳහා හිමිකම් ලබන ආදායම් සීමාවට අයත්, අඩු ආදායම්ලාභී සිසුන් හැර අනෙකුත් සියලුම සිසුන් එම පරීක්ෂණයට ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ. ඒ සඳහා සිසුනට කිසිදු ආකාරයකින් බලපෑම් නොකළ යුතු බවද මෙයින් අවධාරණය කරමි.

5.0 එමෙන්ම, 5 ශ්‍රේණියෙන් අවසන්වන පාසල්වල සිසුන්ගෙන් ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී නොසිටින සිසුන්ට 6 ශ්‍රේණිය සඳහා පාසල් ලබා දීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

6.0 එසේම, සිසුනට සිය අභිමතය පරිදි ශිෂ්‍යත්ව විභාගයට පෙනී නොසිටීමට ඉඩ ලබා දිය හැකි අතර ඒ පිළිබඳව දෙමාපියන් දැනුවත් කර දෙමව්පිය එකඟතාව සම්බන්ධ තොරතුරු ඇතුළත් ගොනුවක් පාසලේ පවත්වාගෙන යා යුතු ය.

7.0 එමෙන්ම පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල පදනම් කර ගනිමින් තරඟකාරීත්වය ප්‍රවර්ධනය වන පරිදි පෝස්ටර්, බැනර් වැනි ප්‍රචාරාත්මක කටයුතු නොකළ යුතු බවද වැඩිදුරටත් දන්වමි. තවද පාසල්වල හය ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී ද අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි පහසුකම් හා සේවා ගාස්තු, පාසල් සංවර්ධන සමිති ගාස්තු වැනි අනුමත ගාස්තු හැර වෙනත් ආධාර මුදල් අය කිරීම හෝ වෙනත් පරිත්‍යාගයන් ලබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

2019/04/17
SAS (ADMIN - I)
MOE

පිටපත් : 1. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - දැ.ගැ.ස
2. විභාග කොමසාරිස් ජනරාල් - දැ.ගැ.ස
3. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - දැ.ගැ.ස

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister: +94112784832 · +94112784825 · minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary: +94112784811 · +94112785162 · secretary.education@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | Fax +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/01/11/01/01/රාජ්‍ය වෙසක්
ඔබේ යොමුව / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } 2019-04-09

සාමාන්‍ය පාලන ශාඛාව
23 APR 2019
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල

චක්‍රලේඛ අංක : 22/2019

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන පරිපාලන)
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ. අ.වරුන්,
සියලුම පරිවේණාධිපතීන් වහන්සේලා,
සියලුම විදුහල්පතිවරුන්,

## ශ්‍රී බුද්ධ වර්ෂ 2563 වන වෙසක් සතිය

## තේමාව - "ධම්මචාරී සුඛං සේති - ධර්මයෙහි හැසිරෙන්නා සුවසේ වෙසේ"

2019 මැයි මස 18 වන සෙනසුරාදා දිනට යෙදී ඇති ශ්‍රී බුද්ධ වර්ෂ 2563 වන වෙසක් පුර පසළොස්වක පොහොය දිනය නිමිත්තෙන් රාජ්‍ය වෙසක් උත්සවය ගාල්ල, තෙල්වත්ත, තොටගමු රත්පත් රජමහා විහාරස්ථානයේ දී පවත්වනු ලැබේ. 2019-05-15 වන දින සිට 2019-05-21 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) වෙසක් සතිය පැවැත්වීමට බුද්ධ ශාසන අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

2019-05-15 වන දින සිට 2019-05-21 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) වෙසක් සතිය වැඩසටහන සමස්ත පාසල්, විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල සඳහා ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කටයුතු සැලසුම් කර ඇත.

මෙම වෙසක් සතිය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ආදර්ශ සැලැස්ම මේ සමඟ ඉදිරිපත් කරන අතර එය බෞද්ධ සිසුන් බහුතරයක් සිටින එම පාසල්වල/ ආයතනවල සුදුසු පරිදි ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දෙමි.

2019-05-17 වන සිකුරාදා දින සියලු බෞද්ධාගමික ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ආචාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සෑම පාසලක ම සීල භාවනා වැඩසටහනක් පැවැත්වීමට කටයුතු යොදන ලෙස දැනුම් දෙමි. වෙසක් සතිය පුරා සෑම නිවසක ම බෞද්ධ කොඩියක් හා අතින් නිම කරන ලද වෙසක් පහන් කූඩුවක් ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට උපදෙස් ලබා දිය යුතුය.

**යෝජිත වෙසක් සතිය ආදර්ශ වැඩ සැලැස්ම පහත දැක්වේ**

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
|---|---|---|
| මැයි මස 15 වන බදාදා | "නිරසර පරිසරයයි බුදු දහමයි" | පාසල අවට පරිසරය පිරිසිදු කිරීම, ආගමික ස්ථාන පිරිසිදු කිරීම, වෙසක් පහන් කූඩු සකස් කිරීම හා ධජ පතාකවලින් සැරසිලි කිරීම. |
| මැයි මස 16 වන බ්‍රහස්පතින්දා | "නිරෝගී ජීවිතයක් සඳහා බුදු දහම" | "ආරෝග්‍යා පරමා ලාභා (නිරෝගී බව උතුම්ම ලාභයයි.)" ගිලානෝපස්ථාන කිරීම, පරිසරය සහ පුද්ගල නිරෝගී භාවයේ ඇති වටිනාකම සිසුන්ට අවබෝධකර දීම හා එය පරිහරණය කර ගැනීම. |
| මැයි මස 17 වන සිකුරාදා | "යහපත් ජීවිතයක් සඳහා බුදු දහම" | අධ්‍යාත්මික සංවර්ධනය සඳහා පාසල් සිසුන්ට සීල භාවනා වැඩසටහන් පැවැත්වීම. |

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
|---|---|---|
| මැයි මස 18 වන සෙනසුරාදා | **"සිල් සුවඳින් නිරතුරු කුසල් රැස් කරන්න"** | ආසන්නතම ගමේ විහාරස්ථානයට පැමිණ සිල් සමාදන්වීම, ධර්ම දේශනා, භාවනා ආදී ප්‍රතිපත්ති පූජාවලට සහභාගී වීම හා සිල් සමාදන් වූ උපාසක උපාසිකාවන්ට උපස්ථාන කිරීම. |
| මැයි මස 19 වන ඉරිදා | **"සාරධර්ම ප්‍රවර්ධනය"** | බෞද්ධාගමික ප්‍රතිපත්තිවලට ගරු කරමින් අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කරන ක්‍රියාවන් හි යෙදීම (සිද්ධස්ථාන නැරඹීම, වෙසක් සිරි නැරඹීම) |
| මැයි මස 20 වන සඳුදා | **"බුදු දහමින් පෝෂිත සිංහල සාහිත්‍ය"** | සැදැහැ ගී ගායනා හා බෞද්ධ නාට්‍ය රඟ දැක්වීම වැනි සෞන්දර්යාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| මැයි 21 වන අඟහරුවාදා | **"සමාජ සංවර්ධනය, ආර්ථිකය හා බුදු දහම"** | 1. බෞද්ධ සංගම් රැස්වීම් පවත්වා මේ පිළිබඳව සාකච්ඡා කිරීම.<br>2. බුදු දහම හා සිරිත් විරිත් පිළිබඳ අවබෝධයක් ලබා දීම<br>3. "**ව්‍යග්ඝපජ්ජ**" සූත්‍රයට අනුව පුද්ගල දියුණුවට මහපෙන්වීම හා පාසල් දැනුවත් කිරීම. |

ඉහත වෙසක් සතිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී, විවිධ ආගමික සිසුන් අතර ආගමික සංහිඳියාව ගොඩනැගෙන අයුරින් හා ඔවුන්ගේ ආගමික අනන්‍යතාවට හානි නොවන අයුරින් කටයුතු කිරීමට විදුහල්පතිවරුන්, විද්‍යාපීඨ පීඨාධිපතිවරුන් හා ගුරු විදුහල්පතිවරුන් වගබලා ගත යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි. වෙසක් සතිය වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබගේ සහාය අපේක්ෂා කරමි.

එම්.එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. ලේකම් - බුද්ධ ශාසන අමාත්‍යාංශය
3. අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්
4. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
5. විභාග කොමසාරිස් ජනරාල්,
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
8. සභාපති - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලය

} කරු. අ.ක.ස. සහ දැ.ගැ.ස

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/12/05/02/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2019.04. 24

චක්‍රලේඛ අංකය:-25/2019

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල් ප්‍රධානීන් වෙත

## පාසල් පරිශ්‍රය තුළ ආරක්ෂාව තහවුරු කිරීම.

රටක අනාගතය සම්බන්ධ ප්‍රධාන තීරණාත්මක සාධකය වන මානව සම්පත සංවර්ධනය කෙරෙන ප්‍රධාන කේන්ද්‍රස්ථානය පාසල යි. ඒ අනුව, සමාජ සංස්ථාවක් ලෙසින් පාසලට පැවරෙන ප්‍රමුඛ කර්තව්‍යයක් වනුයේ ශිෂ්‍ය ප්‍රජාවට සුරක්ෂිත වාතාවරණයක් පාසල තුළ ස්ථාපිත කරමින් පූර්ණ පෞරුෂයකින් යුත් යහපත් පුද්ගලයන් ලෙස සමාජගත වීමට අවස්ථා සැලසීම ය.

පාසල් සිසුන් තම දෛනික සක්‍රිය කාල සීමාවෙන් සැලකිය යුතු කාලයක් පාසල තුළ ගත කරනු ලැබේ. එබැවින්, සිසුන් පාසලට අවතීර්ණ වීමත් සමඟ ම සෑම සිසුවෙකුගේ ම භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධ පූර්ණ වගකීම විදුහල්පති හා සෙසු කාර්ය මණ්ඩලය වෙත පැවරේ. එය තම රාජකාරියෙහි ම කොටසක් වන අතර සමස්ත කාර්ය මණ්ඩලයේ ම වගකීමක් මෙන් ම යුතුකමක් ද වේ.

චක්‍රලේඛ අංක 2011/17 අනුව ළමා අපයෝජන වලක්වා ගනිමින් ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා දැනට පාසල්වල " පාසල් ළමා ආරක්ෂක කමිටු - සුරකුම් පවුව " වැඩපිළිවෙල ක්‍රියාත්මක වුව ද වර්තමානයේ රටේ පවතින ආරක්ෂක තත්ත්වය හේතු කොට ගෙන පාසල් සිසුන්ගේ ආරක්ෂාව සම්බන්ධ ව කටයුතු කිරීමට විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය පැන නැඟී ඇත. ඒ අනුව, මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

### 1.0 පාසල් ප්‍රජාව දැනුවත් කිරීම

සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ සුරක්ෂිතතාව, අනතුරු අවස්ථාවක දී කටයුතු කළ යුතු ආකාරය, අනතුරු හා අවදානම් තත්ත්ව හඳුනාගැනීම හා වළක්වා ගැනීම ආදිය සම්බන්ධයෙන් අවධානය යොමු කර පාසලේ ආරක්ෂක වැඩපිළිවෙලක් සකස් කර ඒ පිළිබඳ ව පාසලේ සියලු ම කාර්ය මණ්ඩලය, සිසුන්, දෙමාපියන් හා ආදි සිසුන් දැනුම්වත් කිරීමට කටයුතු කළ යුතු ය.

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. : ED/01/11/01/01/රාජ්‍ය වෙසක්

ඔබේ යොමුව / உமது இல. / Your Ref. :

දිනය / திகதி / Date : 2019-04-09

චක්‍රලේඛ අංක : 22/2019

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන පරිපාලන)
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ. අ.වරුන්,
සියලුම පරිවේණාධිපතීන් වහන්සේලා,
සියලුම විදුහල්පතිවරුන්,

## ශ්‍රී බුද්ධ වර්ෂ 2563 වන වෙසක් සතිය

### තේමාව - "ධම්මචාරී සුඛං සේති - ධර්මයෙහි හැසිරෙන්නා සුවසේ වෙසේ"

2019 මැයි මස 18 වන සෙනසුරාදා දිනට යෙදී ඇති ශ්‍රී බුද්ධ වර්ෂ 2563 වන වෙසක් පුර පසළොස්වක පොහොය දිනය නිමිත්තෙන් රාජ්‍ය වෙසක් උත්සවය ගාල්ල, තෙල්වත්ත, තොටගමු රත්පත් රජමහා විහාරස්ථානයේ දී පවත්වනු ලැබේ. 2019-05-15 වන දින සිට 2019-05-21 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) වෙසක් සතිය පැවැත්වීමට බුද්ධ ශාසන අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

2019-05-15 වන දින සිට 2019-05-21 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) වෙසක් සතිය වැඩසටහන සමස්ත පාසල්, විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල සඳහා ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කටයුතු සැලසුම් කර ඇත.

මෙම වෙසක් සතිය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ආදර්ශ සැලැස්ම මේ සමඟ ඉදිරිපත් කරන අතර එය බෞද්ධ සිසුන් බහුතරයක් සිටින එම පාසල්වල/ ආයතනවල සුදුසු පරිදි ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දෙමි.

2019-05-17 වන සිකුරාදා දින සියලු බෞද්ධාගමික ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ආචාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සෑම පාසලක ම සීල භාවනා වැඩසටහනක් පැවැත්වීමට කටයුතු යොදන ලෙස දැනුම් දෙමි. වෙසක් සතිය පුරා සෑම නිවසක ම බෞද්ධ කොඩියක් හා අතින් නිම කරන ලද වෙසක් පහන් කූඩුවක් ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට උපදෙස් ලබා දිය යුතුය.

**යෝජිත වෙසක් සතිය ආදර්ශ වැඩ සැලැස්ම පහත දැක්වේ**

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
|---|---|---|
| මැයි මස 15 වන බදාදා | "පිරිසර පරිසරයයි බුදු දහමයි" | පාසල අවට පරිසරය පිරිසිදු කිරීම, ආගමික ස්ථාන පිරිසිදු කිරීම, වෙසක් පහන් කූඩු සකස් කිරීම හා ධජ පතාකවලින් සැරසිලි කිරීම. |
| මැයි මස 16 වන බ්‍රහස්පතින්දා | "නිරෝගී ජීවිතයක් සඳහා බුදු දහම" | "ආරෝග්‍යා පරමා ලාභා (නිරෝගී බව උතුම්ම ලාභයයි.)" ගිලානෝපස්ථාන කිරීම, පරිසරය සහ පුද්ගල නිරෝගී භාවයේ ඇති වටිනාකම සිසුන්ට අවබෝධකර දීම හා එය චරිතායනය කර ගැනීම. |
| මැයි මස 17 වන සිකුරාදා | "යහපත් ජීවිතයක් සඳහා බුදු දහම" | අධ්‍යාත්මික සංවර්ධනය සඳහා පාසල් සිසුන්ට සීල භාවනා වැඩසටහන් පැවැත්වීම. |

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
|---|---|---|
| මැයි මස 18 වන සෙනසුරාදා | "සිල් සුවඳින් නිරතුරු කුසල් රැස් කරන්න" | ආසන්නතම ගමේ විහාරස්ථානයට පැමිණ සිල් සමාදන්වීම, ධර්ම දේශනා, භාවනා ආදී ප්‍රතිපත්ති පූජාවලට සහභාගී වීම හා සිල් සමාදන් වූ උපාසක උපාසිකාවන්ට උපස්ථාන කිරීම. |
| මැයි මස 19 වන ඉරිදා | "සාරධර්ම ප්‍රවර්ධනය" | බෞද්ධාගමික ප්‍රතිපත්තිවලට ගරු කරමින් අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කරන ක්‍රියාවන් හි යෙදීම (සිද්ධස්ථාන නැරඹීම, වෙසක් සිරි නැරඹීම) |
| මැයි මස 20 වන සඳුදා | "බුදු දහමින් පෝෂිත සිංහල සාහිත්‍ය" | සැදැහැ ගී ගායනා හා බෞද්ධ නාට්‍ය රඟ දැක්වීම වැනි සෞන්දර්යාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| මැයි 21 වන අඟහරුවාදා | "සමාජ සංවර්ධනය, ආර්ථිකය හා බුදු දහම" | 1. බෞද්ධ සංගම් රැස්වීම් පවත්වා මේ පිළිබඳව සාකච්ඡා කිරීම.<br>2. බුදු දහම හා සිරිත් විරිත් පිළිබඳ අවබෝධයක් ලබා දීම<br>3. "ව්‍යග්ඝපජ්ජ" සූත්‍රයට අනුව පුද්ගල දියුණුවට මඟපෙන්වීම හා පාසල් දැනුවත් කිරීම. |

ඉහත වෙසක් සතිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී, විවිධ ආගමික සිසුන් අතර ආගමික සංහිඳියාව ගොඩනැගෙන අයුරින් හා ඔවුන්ගේ ආගමික අනන්‍යතාවට හානි නොවන අයුරින් කටයුතු කිරීමට විදුහල්පතිවරුන්, විද්‍යාපීඨ පීඨාධිපතිවරුන් හා ගුරු විදුහල්පතිවරුන් වගබලා ගත යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි. වෙසක් සතිය වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබගේ සහාය අපේක්ෂා කරමි.

එම්.එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. ලේකම් - බුද්ධ ශාසන අමාත්‍යාංශය
3. අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්
4. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
5. විභාග කොමසාරිස් ජනරාල්,
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
8. සභාපති - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලය

} කරු. අ.ක.ස. සහ දැ.ගැ.ස